අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி உயர் கல்வி மற்றும் தொழிற் கல்வி அமைச்சு
**Ministry of Education, Higher Education and Vocational Education**

47 S I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2024 (2025)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2024 (2025)
General Certificate of Education (Ord.Level) Examination, 2024(2025)

| | | |
|---|---|---|
| සිංහල සාහිත්‍ය රසාස්වාදය | **I, II** | පැය තුනයි |
| இலக்கிய நயம் சிங்க | **I, II** | மூன்று மணித்தியாலம் |
| Appreciation of Sinhala Literary Texts | **I, II** | Three hours |

**අමතර කියවීම් කාලය - මිනිත්තු 10යි**
மேலதிக வாசிப்பு நேரம் – 10 நிமிடங்கள்
Additional Reading Time-10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.**

විභාග අංකය : ....................................

උපදෙස්:

(i) I හා II පත්‍රය සඳහා පිළිතුරු සපයා සම්පූර්ණ කාලය අවසානයේ දී වෙන වෙන ම භාරදිය යුතු ය.

(ii) I පත්‍රය සඳහා පිළිතුරු මෙම පත්‍රයේ ම ලිවිය යුතු ය.

(iii) II පත්‍රය සඳහා පිළිතුරු සැපයීමට උත්තර ලියන පොත භාවිත කරන්න.

(iv) I පත්‍රය සඳහා ලකුණු 40ක් ද II පත්‍රය සඳහා ලකුණු 60ක් ද හිමි වේ.

**සිංහල සාහිත්‍ය රසාස්වාදය - I පත්‍රය**
(**සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු මෙම පත්‍රයේ ම සපයන්න).

1. (i) සිට (v) තෙක් ඇති කොටස් කියවා, ඒ ඇසුරින් අසා ඇති (අ), (ආ) ප්‍රශ්නවලට **කෙටි පිළිතුරු,** දී ඇති හිස්තැන්වල පමණක් ලියන්න.

(i) “මුඹ වහන්සේ බුදු බව සාධා ගන්ට දුක් ගන්නා සමයේ ගන්නා දුක් බලවත් හෙයින් එක් දේවතාවෙක් මා ළඟට අවුත් මුඹ වහන්සේ මළැයි යන්නක් කීය.”

(අ) මෙම ප්‍රකාශය කළේ කවරෙක් ද?

.....................................................................................................................

(ආ) මේ පාඨය උපුටා ගත් මුල් කෘතියේ කතුවරයා නම් කරන්න.

.....................................................................................................................

(ii) “ඩිංගිරිගෙන් බත් ඉල්ලාගෙන කාලා නිදාගන්න.”

(අ) මේ ප්‍රකාශය ඇතුළත් නිර්මාණයේ නම කුමක් ද?

.....................................................................................................................

(ආ) මේ ප්‍රකාශය කරන ලද්දේ කවුරුන් විසින් ද?

.....................................................................................................................

(iii) “ඇතොත් ගමට ආදරයක් සිතින් සිපා
අ ත ත් පයත් ඔළුවත් වෙන වෙන ම කපා
ක තත් කමක් නැහැ බියසුලු ගතිය පපා
අ යු ත්තකට අත්දෙක ඔසවන්න එපා”

(අ) මේ පද්‍යය ඇතුළත් පැදිපෙළේ රචකයා නම් කරන්න. .

..........................................................................

(ආ) මෙහි නොකළ යුතු දෙයක් ලෙස දක්වා ඇත්තේ කුමක් ද?

.....................................................................

(iv) කොතෙක් වෙහෙස ලදුවත් සුදනෝ පවර
උ ද ක් ලොව සතුන් සිත දුක් කෙරෙති දුර
**ප ස ක්** රාහු මුව පත් වෙමිනි බිය කර
අ නි ක් පසින් ලොව හෙළි කෙරෙය **හිමකර**

(අ) මෙම කවියේ මුල් පද දෙකෙහි අදහස ලියන්න.

...........................................................................................................................

...................................................................................................................

...................................................................................................................

(ආ) තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථ ලියන්න.

පසක් ..............................

හිමකර .............................

(v) “අක්කවත් වෙලාවක කියන්ඩකො ලොකු අයියට ඔය පරණ දේවල් ගැන හිත හිතා ඉන්නැතුව කසාදයක් බැඳ ගන්ඩ කියලා.”

(අ) මේ පාඨය උපුටා ගත් නිර්මාණයේ කතුවරයා කවරෙක් ද?

........................................................................................................................

(ආ) මෙහි ලොකු අයියා යනුවෙන් හැඳින්වූ අයගේ නම ලියන්න.

........................................................................................................................

(ලකුණු 04x5 = 20යි)

2. පහත දැක්වෙන ගද්‍ය - පද්‍ය කොටස් දෙකෙන් **එක්** කොටසකට **පමණක්** පිළිතුරු සපයන්න.

මමත් මෙතැන් පටන් කයින් වචනින් මනසින් අප්‍රියයක් නො කෙරෙමි. මේ එක මද්‍ර රජ කුලය තබා මෙබඳු නො යෙක් සිය ගණන් රාජ කුලයන් මර්දනය කොට මා කැමති පරිද්දෙන් තොප ඇර ගෙන යන්ට සමර්ථ වුවත් මම තොප නිසා මාගේ එබඳු රාජ්‍ය ශ්‍රීය හැර හීන ක්‍රියා කෙරෙමින් මෙතෙක් දවස් මුළුල්ලෙහි දුක් වින්දෙමි. එබඳු වූ මා පෙනී සිටිය දී තොපට කිසි යම් භයකුත් නැත්තේය"යි යනාදීන් ප්‍රභාවතීන් අස්වසා සියලු රජපිරිවරින් පිරිවරන ලදුව ක්ෂත්‍රියමාන උපදවාගෙන "මා ජීවත් ව සිටිය දී මාගේ භාර්යාව අනිකෙකු ඇර ගෙන යෙතැ"යි කේශර සිංහරාජයකු මෙන් පැලඹෙමින් " මේ සියලු සාගල නුවර වාසීහු මා මෙතනට ආ බව දනිත්ව"යි ඈත මෑත පනිමින් අභීත නාද පවත්වමින් අත්පොළසන් දෙමින් "දැන් දැන් ඒ කොල්ලන් ජීවග්‍රහයෙන් අල්වාගෙන එමි." සියලු අන්තඃපුර වාසීන් අස්වසා "තව ද මණිකනක රජතාදී විචිත්‍ර චිත්‍ර කර්මාන්තයෙන් විරාජමාන වූ රථ යානාවෙක්හි හික්මුණා වූ කීකරු සියලු අශ්වාලංකාරයෙන් සරහන ලද අශ්වයන් යොදව. දැන් දැන් ශත්‍රුමර්ධනය කරන්නා වූ මාගේ බල පරාක්‍රම සාමර්ථ්‍යය බලව."යනාදීන් අභීත නාද පවත්වමින් " ශත්‍රුමර්ධනය කිරීම මට භාරය, තෙපි තොපගේ මාළිගාවට ගොස් ඉස්සෝධා නහා සැරැහී ගන වැද හිඳුවයි ප්‍රභාවතීන් එතනින් නික්මවූහ. එකල මද්‍ර රජ්ජුරුවෝ ද කුස රජ්ජුරුවන්ට පිරිස් සරහන පිණිස අමාත්‍යයන් යවූහ. ඒ නියෝග ලද අමාත්‍යයෝ ගොස් මුළුතැන්ගෙයි මිදුලෙහි වටතිරයක් බැඳ එලවන ලද ඒ මගුල්කපුවා විසින් කරන ලද දැළි රැවුලු අන්දම් තිබීම් ඇතිව ඉස් සෝධා නහා සියලු රාජාභරණයෙන් සැරැහී ඇමති මඬුලු ආදී දශ මේ තැන් පිරිවරා මාළිගාවට යෙමින් අත් පොළසන් දෙමින් සියලු අන්තඃපුර සත්වයන් බල බලා සතුටුවන පරිද්දෙන් අභීත නාද පැවැත්වූහ.

(i) පාඨයෙහි ඇතුළත් උපමාවක් උපුටා දක්වන්න.

.....................................................................................................................

.....................................................................................................................

(ලකුණු 04යි)

(ii) කුසරජු අභීත නාද පවත්වමින් කළ ප්‍රකාශය දෙක උපුටා දක්වන්න.

.....................................................................................................................

.....................................................................................................................

.....................................................................................................................

(ලකුණු 04යි)

(iii) තව ද මණිකනක රජතාදී විචිත්‍ර චිත්‍ර කර්මාන්තයෙන් විරාජමාන වූ රථ යානාවෙක්හි හික්මුණා වූ කීකරු සියලු අශ්වාලංකාරයෙන් සරහන ලද අශ්වයන් යොදව.''මෙම පාඨයෙහි අර්ථය ලියන්න.

.....................................................................................................................

.....................................................................................................................

.....................................................................................................................

.....................................................................................................................

(ලකුණු 06යි)

(iv) මද්‍ර රජු කුස රජ්ජුරුවන්ට පිරිස් සරහන පිණිස යැවූ අමාත්‍යවරුන් ක්‍රියා කළ ආකාරය කෙටියෙන් විස්තර කරන්න.

.....................................................................................................................

.....................................................................................................................

.....................................................................................................................

.....................................................................................................................

.....................................................................................................................

(ලකුණු 06යි)

**නැතහොත්**

ගොඩේ කන්දෙ මූකලාන කම්පා කරමින්නේ
රුස්සයෙකි රෑ පාළුව බිඳගෙන ඇද වැටුණේ
අඩ නින්දෙ ම පන් පැදුරට උණු කඳුළක් හැලුණේ
මූකලාන පස් වැටියක් වී හීනෙන් පෙනුණේ

යස දරුවන් ගෙන ඇකයෙන් කැපුවත් නොසැලෙන්නේ
දුක් කරදර කෝටියක්ම ගිලගෙන හිනැහෙන්නේ
සියතින් මර විපත කටින මිනිසුන් දකිමින්නේ
මහා පුරුෂයකු වාගේ කන්ද නැගී ඉන්නේ

පිරුණු ලොරිය ගම දොරකඩ පියමං කර යනවා
පාර වුණත් හිරිහැරයක් නෑ ඔහෙ නිදියනවා
පැලේ වහල ඇද හැළිලා මාසයක් ම වෙනවා
පරාල තුනකට අයියා හිරේ හුහුං ලනවා

පොරොව, කියත කලුවරේ ම පණ ආවා ලෙසිනේ
මගෙ ඇඟ උඩ පට්ටල් බැඳ කපනු ඉරනු වැන්නේ
දෙයියන්ගේ මල්ලිලාට දෙවියො ම රැවටෙන්නේ
කාන්තාර ගම මායිම් තවත් පුළුල් වෙන්නේ

(i) මිනිසුන්ගේ පියවි ඇසට වසන් ව ගස් කැපීම සිදුවන බව කවියා ප්‍රකාශ කර ඇත්තේ කෙසේ ද?

.............................................................................................................................

.............................................................................................................................

(ලකුණු 04යි)

(ii) ධනවතුන්ට සහ දුප්පතුන්ට නීතිය ක්‍රියාත්මක වන ආකාරයේ පරස්පරතා පවතින බව ඇඟවෙන පද්‍යය උපුටා දක්වන්න.

.............................................................................................................................

.............................................................................................................................

.............................................................................................................................

.............................................................................................................................

(ලකුණු 04යි)

(iii) මිනිස් ක්‍රියාකාරකම් ස්වභාවධර්මයට කරන බලපෑම අපූර්වත්වයෙන් කවියට නැඟීමට කවියා සමත්ව ඇති ආකාරය කෙටියෙන් විස්තර කරන්න.

.............................................................................................................................

.............................................................................................................................

.............................................................................................................................

.............................................................................................................................

(ලකුණු 06යි)

(iv) කවියා යොදා ගෙන ඇති භාෂාව පැදි පෙළේ සාර්ථක භාවයට හේතු වී ඇති අයුරු පැහැදිලි කරන්න.

.............................................................................................................................

.............................................................................................................................

.............................................................................................................................

.............................................................................................................................

.............................................................................................................................

(ලකුණු 06යි)

**අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය**
கல்வி உயர் கல்வி மற்றும் தொழிற் கல்வி அமைச்சு
**Ministry of Education, Higher Education and Vocational Education**

47 S I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2024 (2025)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2024 (2025)
General Certificate of Education (Ord.Level) Examination, 2024(2025)


සිංහල සාහිත්‍ය රසාස්වාදය I, II
இலக்கிய நயம் சிங்களம் I, II
Appreciation of Sinhala Literary Texts I, II

**සිංහල සාහිත්‍ය රසාස්වාදය - II පත්‍රය**

- පළමුවන ප්‍රශ්නය ද, 2, 3, 4, 5 ප්‍රශ්නවලින් තෝරා ගත් ප්‍රශ්න දෙකක් ද ඇතුළු ව ප්‍රශ්න තුනකට පිළිතුරු සපයන්න.
- මෙම පත්‍රය සඳහා පිළිතුරු සැපයීමට පිළිතුරු ලියන පොත භාවිත කරන්න.

01 පහත සඳහන් පැදි පෙළ කියවා දී ඇති කරුණු කෙරෙහි සැලකිලිමත් වෙමින් රසාස්වාදයක් කරන්න.

දකුණේ මෙන් ම උතුරෙත් හිරු නඟියි උදේ
රන් තරු රිදී තරු සවසට පෙළට ඇදේ
හද ඇති දාට රසබර රැස් දහර හදේ
පොල් ගස් මුදුනෙ මෙන් තල් ගස් මුදුනෙ වැදේ

ගෙන එයි මිහිරි ගී මදනල හමන විට
වැටහෙයි නො වැටහුණු සැඟවුණු කරුණු මට
නිල් පැහැයක් නැතත් මේ වැලි පොළොව පිට
උදයට පෙනේ බොල් පිනි බිඳු පබලු ඇට

තනි බව දැනේ එහි කවුතුක රසය ඇත
මා පිට ගෙයක බව සලකනු පුරුදු නැත
හැම මොහොතක ම ඇති උණුසුම් ගතිය මත
උගතිම් කිම ද මිනිසා සතු දෙ නෙත

ඩහදිය හෙළන අය හිරිහැර අතර වැටී
දකුණේ මෙන් ම උතුරෙත් හැම තැන සිටී
විමසා බලමි ඔවුනගෙ හදවතෙහි හැටී
කළුගල් යකඩ නො ව උණු වී හැළෙන ඉටී

බැඳ ඇති විලංගුව පා මිණි සලඹ කොට
සලකා වැටෙන එය බැන්දහු ඉදිරි පිට
මිනිසුන් දකුණෙ මෙන් උතුරෙත් පෙනෙන විට
සිහියෙන් තුරන් වෙයි හෙට යන දවස මට

මිනිහා වෙතින් මිනිහා වෙන් කරන රිසින්
බැඳ ඇති පවුරු පදනම් කිසි කෙනෙකු විසින්
ඒවා කඩා බිඳගෙන එහි පිරුණු පසින්
පාලම බැඳෙනු ඇත දවසක උතුරු දෙසින්

පැයක දී එකට හමුවන දුර ඇත දෙතැන
මෙය වෙන් කරනු හැකි කිසිවෙකු වෙ ද කොතැන
සුරුට්ටුවට එක් වී උතුරේ ඔතන
බේදය පිළිස්සී හමු වේවා දකුණ

(අ) මේ පැදිපෙළට පාදක වූ අත්දැකීම

(ආ) ඒ අත්දැකීම් ප්‍රතිනිර්මාණය සඳහා කවියා යොදා ගත් අවස්ථා

(ඉ) භාෂා භාවිතය

(ඊ) සමාජ ක්‍රමය පිළිබඳ විරෝධාකල්ප මතුවන අවස්ථා

(උ) මෙම පද්‍ය නිර්මාණයේ සාර්ථකත්වයට හේතු වූ කාව්‍යෝක්ති

(ලකුණු 06x5 = 30යි)

02. "අනෙකා කෙරෙහි සංවේදී වීම අත් හළ සමාජයක මිනිසාගේ හුදෙකලාව 'වැලපීම' කෙටි කතාවෙන් පිළිබිඹු වේ." විමසන්න.

(ලකුණු 15යි)

03. ඇතුන් පිළිබඳ සාම්ප්‍රදායික දැනුම 'ඇත් ගාලේ දරු පෙම' නිර්මාණය සාරවත් කර ගැනීම සඳහා උපයෝගී කර ගෙන ඇති ආකාරය නිදසුන් තුනක්වත් සහිත ව පහදන්න.

(ලකුණු 15යි)

04. සද්ධර්මරත්නාවලී කතුවරයා උපමා භාවිතයෙහි දක්වා ඇති නිපුණතාව නන්ද තෙරුන් වහන්සේගේ වස්තුවෙන් නිදසුන් තුනක්වත් ඇසුරෙන් විස්තර කරන්න.

(ලකුණු 15යි)

05. ජන කවියා සිය නිර්මාණ සඳහා උපයුක්ත භාෂාව අර්ථ රසයෙන් මෙන් ම ශබ්ද රසයෙන් ද අනූන ය. නිර්දිෂ්ට ජන කවි ඇසුරෙන් ඇගයීමක් කරන්න.

(ලකුණු 15යි)

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2024 (2025)

**සිංහල සාහිත්‍ය රසාස්වාදය**

**I පත්‍රය - පිළිතුරු**

01. (i) (අ) සුදොවුන් රජු/සුද්දෝධන රජු

(ආ) ධර්මසේන හිමි

(ii) (අ) වෙසක් පහන

(ආ) මව/අම්මා

(iii) (අ) ඇස්. මහින්ද හිමි

(ආ) අයුක්තකට අත් දෙක එසවීම

(iv) (අ) කොතරම් වෙහෙසට පත් වුවත් උතුම් සත්පුරුෂයෝ ලෝක සත්ත්වයාගේ සිතෙහි පවතින දුක ඒකාන්තයෙන් ම ඉවත් කරති.

(ආ) පසක් - පැත්තක්
හිමකර - චන්ද්‍රයා/ සඳ…

(v) (අ) මහගම සේකර

(ආ) අබිලිං

(ලකුණු 04×5 20යි)

02. (i) කේශර සිංහරාජයකු මෙන්

(මෙම උපමාව උපුටා දක්වා ඇත්නම් සම්පූර්ණ ලකුණු පිරිනමන්න.)

(ලකුණු 04යි)

(ii) දැන් දැන් ඒ කොල්ලන් ජීවග්‍රහයෙන් අල්වා ගෙන එමි.

දැන් දැන් ශත්‍රුමර්ථනය කරන්නා වූ මාගේ බල පරාක්‍රම සාමර්ථ්‍යය බලව

(ලකුණු 04යි)

(iii) තව ද මැණික් සහ රත්රන්වලින් ද රිදියෙන් ද විචිත්‍ර වූ සිතුවම්වලින් බැබළෙන්නා වූ රථ යානාවල හික්මුණු කීකරු සියලු ආකාරයෙන් සරසන ලද අශ්වයන් යොදන්න.

(ලකුණු 06යි)

(iv) නියෝග ලද අමාත්‍යවරු ගොස් මුළුතැන්ගෙයි මිදුලෙහි වට තිරයක් බැඳ මඟුල් කපුවා විසින් කරන ලද දැළි රැවුළු අන්දම් තිබීම් ඇති ව ඉස් සෝධා නා සියලු රාජාභරණයෙන් සැරසී ඇමති ආදී මඩුලු දස දහසක් පිරිවරා ගෙන මාළිගාවට පැමිණියහ.

(ලකුණු 06යි)

නැතහොත්

(i) රුස්සයෙකි රෑ පාළුව බිඳගෙන ඇද වැටුණේ

(ලකුණු 04යි)

(ii) පිරුණු ලොරිය ගම දොරකඩ පියමං කර යනවා
පාර වුණත් හිරිහැරයක් නෑ ඔහෙ නිදියනවා
පැලේ වහල ඇද හැළිලා මාසයක් ම වෙනවා
පරාල තුනකට අයියා හිරේ හුහුං ලනවා

(ලකුණු 04යි)

(iii) • රාත්‍රී කාලයේ ගස් කැපීම සිදුවන බවත් ගස් කැපීම නිසා සිදුවන හානියත් විස්තර කර ඇති ආකාරය

රුස්සයෙකි රෑ පාළුව බිඳගෙන ඇද වැටුණේ
මූකලාන පස් වැටියක් වී හීනෙන් පෙනුණේ

• ස්වභාව ධර්මය මිනිසාගේ ක්‍රියාකාරකම් කෙරෙහි උපේක්ෂා සහගත ව සිටින ආකාරය

සියතින් මර විපත කටින මිනිසුන් දකිමින්නේ
මහා පුරුෂයකු වාගේ කන්ද නැඟී ඉන්නේ

• මුදලට සියල්ල යටවන ආකාරයත් අවසන නොදැනීම ගම කාන්තාරයක් වන ආකාරයත්

දෙයියන්ගේ මල්ලිලාට දෙවියො ම රැවටෙන්නේ
කාන්තාර ගම මායිම් තවත් පුළුල් වෙන්නේ

වැනි කරුණු දක්වමින් විස්තර කර තිබීම අවශ්‍ය ය.

(ලකුණු 06යි)

(iv) • ගැමි වහර යොදා ගෙන ඇති අයුරු

| | |
|---|---|
| මූකලාන | රුස්සයෙකි |
| ඇකයෙන් | මර විපත |
| හුහුං ලනවා | පට්ටල් බැඳ |
| ඇද හැළිලා | ගම මායිම් |

ව්‍යංගාර්ථවත් යෙදුම්

ගොඩේ කන්දෙ මූකලාන කම්පා කරමින්නේ
මූකලාන පස් වැටියක් වී හීනෙන් පෙනුණේ
පාර වුණත් හිරිහැරයක් නෑ ඔහෙ නිදියනවා
දෙයියන්ගේ මල්ලිලාට දෙවියො ම රැවටෙන්නේ
කාන්තාර ගම මායිම් තවත් පුළුල් වෙන්නේ

අජීව වස්තූන්ට සජීවීත්වයක් ආරෝපණය කිරීම

මූකලාන කම්පා කරමින්නේ
යස දරුවන් ගෙන ඇකයෙන්
දුක් කරදර කෝටියක් ම ගිලගෙන හිනැහෙන්නේ
පාර වුණත් හිරිහැරයක් නෑ ඔහෙ නිදියනවා
පොරොව, කියත කලුවරේ ම පණ ආවා ලේසිනේ
දෙයියන්ගේ මල්ලිලා

වැනි කරුණු දක්වමින් විස්තර කර තිබීම අවශ්‍ය ය.

(ලකුණු 06යි)

**සිංහල සාහිත්‍ය රසාස්වාදය**
**II පත්‍රය - පිළිතුරු**

01.

අ) මේ පැදි පෙළට පාදක වූ අද්දැකීම්

මේ පැදි පෙළට පාදක වී ඇත්තේ ප්‍රාදේශික වශයෙන් බෙදී වෙන්වුණු සහ බෙදා වෙන් කරන ලද මිනිසුන් පිළිබඳ අත්දැකීමකි.

මිනිහා වෙතින් මිනිහා වෙන් කරන රිසින්

පැයක දි එකට හමුවන දුර ඇත දෙතැන

බේදය පිලිස්සී හමු වේවා දකුණ

මිනිසුන් දකුණෙ මෙන් උතුරෙත් පෙනෙන විට

මෙවැනි කරුණු සහිත ව උදාහරණ තුනක්වත් ඉදිරිපත් කරමින් සවිස්තරාත්මක පිළිතුරක් ලියා තිබිය යුතු ය.

*උදාහරණ 03කට ලකුණු 03යි.*
*විස්තරයට ලකුණු 03යි.*
*(ලකුණු 03+03 = 06)යි.*

ආ) ඒ අද්දැකීම් ප්‍රතිනිර්මාණය සඳහා කවියා යොදා ගත් අවස්ථා

- සෑම ප්‍රදේශයකට ම සොබා දහමේ සිදු වීම් පොදු බව

දකුණේ මෙන් ම උතුරෙත් හිරු නඟියි උදේ
උදයට පෙනේ බොල් පිනි බිඳු පබළු ඇට

- මිනිසුන් සමාන කාර්යයන්හි නිරත වන අයුරු

ඩහදිය හෙළන අය හිරිහැර අතර වැටී
දකුණේ මෙන් ම උතුරෙත් හැම තැනම සිටී

- මිනිසුන්ගේ ගති ලක්ෂණවල සමාන බව

බැඳ ඇති විලංගුව පා මිණි සලඹ කොට
සලකා වැටෙන එය බැන්දහු ඉදිරි පිට

- වෙනත් බලවේග ක්‍රියාකර ඇති අයුරු

මිනිහා වෙතින් මිනිහා වෙන් කරන රිසින්
බැඳ ඇති පවුරු පදනම් කිසි කෙනෙකු විසින්

මෙවැනි කරුණු සහිත ව උදාහරණ තුනක්වත් ඉදිරිපත් කරමින් සවිස්තරාත්මක පිළිතුරක් ලියා තිබිය යුතු ය.

*උදාහරණ 03කට ලකුණු 03යි.*
*විස්තරයට ලකුණු 03යි.*
*(ලකුණු 03+03 = 06)යි.*

ඉ) භාෂා භාවිතය

- සරල බස් වහරක් යොදා ගැනීම

දකුණේ මෙන් ම උතුරෙත් හිරු නඟියි උදේ
පැයක දි එකට හමුවන දුර ඇත දෙතැන

- කාව්‍යෝක්ති භාවිතය

නිල් පැහැයක් නැතත් මේ වැලි පොළොව පිට

උදයට පෙනේ බොල් පිනි බිඳු පබළු ඇට

කළුගල් යකඩ නො ව උණු වී හැළෙන ඉටී

සුරුට්ටුවට එක් වී උතුරේ ඔතන

බේදය පිලිස්සී හමු වේවා දකුණ

- අනුප්‍රාසවත් ලෙස බස හැසිරවීම

වැටහෙයි නො වැටහුණු සැඟවුණු කරුණු මට

පොල් ගස් මුදුනෙ මෙන් තල් ගස් මුදුනෙ වැදේ

රන් තරු රිදී තරු

මෙවැනි කරුණු සහිත ව උදාහරණ තුනක්වත් ඉදිරිපත් කරමින් සවිස්තරාත්මක පිළිතුරක් ලියා තිබිය යුතු ය.

*උදාහරණ 03කට ලකුණු 03යි.*
*විස්තරයට ලකුණු 03යි.*
*(ලකුණු 03+03 = 06)යි.*

ඊ) සමාජ ක්‍රමය පිළිබඳ විරෝධාකල්ප මතු වන අවස්ථා

ඩහදිය හෙළන අය හිරිහැර අතර වැටී
දකුණේ මෙන් ම උතුරෙත් හැම තැනම සිටී

මිනිසා වෙතින් මිනිසා වෙන් කරන රිසින්
බැඳ ඇති පවුරු පදනම් කිසි කෙනකු විසින්

බැඳ ඇති විලංගුව හා මිණි සලඹ කොට
සලකා වැටෙන එය බැන්දහු ඉදිරි පිට

මිනිසුන් දකුණෙ මෙන් උතුරෙත් පෙනෙන විට
සිහියෙන් තුරන් වෙයි හෙට යන දවස මට

මිනිහා වෙතින් මිනිහා වෙන් කරන රිසින්
බැඳ ඇති පවුරු පදනම් කිසි කෙනෙකු විසින්

මෙවැනි කරුණු සහිත ව උදාහරණ තුනක්වත් ඉදිරිපත් කරමින් සවිස්තරාත්මක පිළිතුරක් ලියා තිබිය යුතු ය.

*උදාහරණ 03කට ලකුණු 03යි.*
*විස්තරයට ලකුණු 03යි.*
*(ලකුණු 03+03 = 06)යි.*

උ) මෙම පද්‍ය නිර්මාණයේ සාර්ථකත්වයට හේතු වූ කරුණු

- කාලීන අද්දැකීමක් තේමාව කොට ගැනීම

  ප්‍රාදේශික වශයෙන් මිනිසුන් අතර විෂමතා පවතින බව

- පද්‍ය නිර්මාණයේ තේමාවට උචිත ලෙස බස හැසිරවීම මගින් මිනිසුන් බෙදී වෙන් වුව ද සියල්ලගේ ම සිතුම් පැතුම් එක සමාන බව ඇඟවීම.

  මිනිසුන් දකුණෙ මෙන් උතුරෙත් පෙනෙන විට
  මෙය වෙන් කරනු හැකි කිසිවෙකු වෙ ද කොතැන

- ව්‍යංග්‍යාර්ථවත් යෙදුම් භාවිතය

  කළුගල් යකඩ නො ව උණු වී හැළෙන ඉටී

  උදයට පෙනේ බොල් පිනි බිඳු පබළු ඇට

  පාලම බැඳෙනු ඇත දවසක උතුරු දෙසින්

  සුරුට්ටුවට එක් වී උතුරේ ඔතන
  බේදය පිලිස්සී හමු වේවා දකුණ

  බැඳ ඇති විලංගුව පා මිණී සලඹ කොට
  සලකා වැටෙන එය බැන්දහු ඉදිරි පිට

මෙවැනි කරුණු සහිත ව උදාහරණ තුනක්වත් ඉදිරිපත් කරමින් සවිස්තරාත්මක පිළිතුරක් ලියා තිබිය යුතු ය.

*උදාහරණ 03කට ලකුණු 03යි.*
*විස්තරයට ලකුණු 03යි.*
*(ලකුණු 03+03 = 06)යි.*
*(ලකුණු 06x5 = 30)*

02.

- පූ තන කිරෙහි කිරි මිල ගෙවන්නාක් මෙන්...
- දිවුල් ලාටු මුසු වයිති තර ව වැදගන්නා සේ...
- කලට පිපෙන මල් පිපී මුත් නො නවත්නා සේ...
- බස් නමැති වයිති පෙම් නමැති දිවුළු ලා මුසු කොට, සිත් නමැති බිතක ඇඳ ලූ හෙයින්...
- රන් නැවක් මධ්‍ය කොට පිපී වැනී ගිය රත් නෙලුම් වනයක් සේ...

මෙබඳු කරුණු සහිත නිදසුන් තුනක්වත් උපයෝගී කර ගනිමින් සවිස්තරාත්මක පිළිතුරක් ලියා තිබිය යුතු ය.

*අදාළ උදාහරණ සඳහා එක් උදාහරණයකට ලකුණු 2 බැගින් ලකුණු 06යි. (02x03 = ලකුණු 06)*
*එම උදාහරණ මැනවින් විස්තර කිරීම සඳහා ලකුණු 06යි.(02x03 = ලකුණු 06)*
*භාෂා නිරවද්‍යතාව සඳහා ලකුණු 02යි.*
*ප්‍රමාණවත් පිළිතුරක් සපයා ඇත්නම් ලකුණු 01යි.*
*සමස්ත ලකුණු (06+06+02+01 = ලකුණු 15)යි.*

03.

- එක දරුවෙක් ඇති
  වුණොත් රජ්ජුරුවෝ අපෙ
  කාටත් කිරි එරි
  ලා එනවා

- බෝසත් මුත්තල
  ඉස්සර හිටියලු...

- දළ දත් දුන්නලු
  බුදු බව ලැබුවලු

- මිනිසුන් අතරේ
  සමගිය නැති වී
  බුදු හාමුරුවෝ
  එදා අනේ

- පාරිලෙයිය වන-
  යට වැඩි දා අපෙ
  මුත්ත කෙනෙකි
  උපකාර වුණේ

මෙබඳු කරුණු සහිත නිදසුන් තුනක්වත් උපයෝගී කර ගනිමින් සවිස්තරාත්මක පිළිතුරක් ලියා තිබිය යුතු ය.

*අදාළ උදාහරණ සඳහා එක් උදාහරණයකට ලකුණු 2 බැගින් ලකුණු 06යි. (02x03 = ලකුණු 06)*
*එම උදාහරණ මැනවින් විස්තර කිරීම සඳහා ලකුණු 06යි.(02x03 = ලකුණු 06)*
*භාෂා නිරවද්‍යතාව සඳහා ලකුණු 02යි.*
*ප්‍රමාණවත් පිළිතුරක් සපයා ඇත්නම් ලකුණු 01යි.*
*සමස්ත ලකුණු (06+06+02+01 = ලකුණු 15)යි.*

04.

- කරත්තයේ විබෝර්ග් පාරට යාමට පැමිණි යුද්ධ නිලධාරියාගේ හැසිරීම හා ඉයෝනා සිය පුතුගේ මරණය ගැන පැවසූ විට දක්වන නොසැලකිලිමත් ප්‍රතිචාරය
- තරුණයන් තිදෙනාගේ හැසිරීම
- කුදු තරුණයා ඉයෝනාට කතා කරන ආකාරය
- ඉයෝනා සිය පුතුගේ මරණය පිළිබඳ අනුවේදනීය අද්දැකීම හුවමාරු කර ගැනීමට උත්සාහ කළ ද ඔහුගේ සේවය ලබන කිසිවෙකුටත් ඊට උනන්දුවක් නොතිබීම
- මුරකරුවා දක්වන මිත්‍රශීලි නොවන ප්‍රතිචාරය
- නිදිමතේ සිටින තරුණ රියකරුගේ ප්‍රතිචාරය
- ඉයෝනා අශ්වයා සමග සිය කතාව පැවසීම

මෙබඳු කරුණු සහිත නිදසුන් තුනක්වත් උපයෝගී කර ගනිමින් සවිස්තරාත්මක පිළිතුරක් ලියා තිබිය යුතු ය.

*අදාළ උදාහරණ සඳහා එක් උදාහරණයකට ලකුණු 2 බැගින් ලකුණු 06යි. (02x03 = ලකුණු 06)*
*එම උදාහරණ මැනවින් විස්තර කිරීම සඳහා ලකුණු 06යි.(02x03 = ලකුණු 06)*
*භාෂා නිරවද්‍යතාව සඳහා ලකුණු 02යි.*
*ප්‍රමාණවත් පිළිතුරක් සපයා ඇත්නම් ලකුණු 01යි.*
*සමස්ත ලකුණු (06+06+02+01 = ලකුණු 15)යි.*

05.

අර්ථ රසය -

උපමා රූපක භාවිතය - දුනුකේ මල සේ උළු ගෙයි ඇඳ පිට
ඔලිඳ කෙළින සැටි බලන් කලු

කාව්‍යෝක්ති - නළල් වටින් එන දාඩිය මුතු කැටියේ…

රිදියෙන් තනලා රත්රන් ඔබලා…

බෝ්ඹු ඉදල දලු ලා දෝ නොලා දෝ …

ශබ්ද රසය -

එළිසමය හා අනුප්‍රාසය - රිදියෙන් තනලා…
ඉරට ඉරක් නැත …
ලස්සන හිමවතේ…
බෝ්ඹු ඉදල දලු ලා දෝ නොලා දෝ …
ලත් පමණට මැටි…

මෙබඳු කරුණු සහිත නිදසුන් තුනක්වත් උපයෝගී කර ගනිමින් සවිස්තරාත්මක පිළිතුරක් ලියා තිබිය යුතු ය.

*අදාළ උදාහරණ සඳහා එක උදාහරණයකට ලකුණු 2 බැගින් ලකුණු 06යි. (02x03 = ලකුණු 06)*
*එම උදාහරණ මැනවින් විස්තර කිරීම සඳහා ලකුණු 06යි.(02x03 = ලකුණු 06)*
*භාෂා නිරවද්‍යතාව සඳහා ලකුණු 02යි.*
*ප්‍රමාණවත් පිළිතුරක් සපයා ඇත්නම් ලකුණු 01යි.*
*සමස්ත ලකුණු (06+06+02+01 = ලකුණු 15)යි*